වේරුගල් ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 ජුනි 05 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 ජුලි 16 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 30 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වේරුගල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.3.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති

---------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ යොදාගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ඌනතා

-------------------------

2015 වර්ෂයේදී රු.178,870 කට වාහන සඳහා මිලට ගත් ටයර්, ටියුබ් සහ බැටරි වටිනාකම ප්‍රාග්ධන කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර වත්කම් වටිනාකම ඒ සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

------------------

වසර 09 ක් තිස්සේ බේරුම් නොකර පවතින එකතුව රු. 47,954 ක් වූ විවිධ ණයගැතියන් සිව් දෙනෙක් මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------

එක් එක් ගිණුම් විෂය ඉදිරියෙන් දක්වා ඇති පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| කර්මාන්ත ණයගැතියන් | 7,142,375 | ණයගැති තහවුරු ලිපි<br>කාල විශ්ලේෂණය |
| ණය හිමියන් | 13,094,010 | |
| අනෙකුත් ආයෝජන | 233,820 | විස්තරාත්මක ලැයිස්තු |

1.3.5 නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) රීති- පරිච්ඡේදය x වගන්තිය - 193 | වර්ෂයේ ආදායම් සහ වියදම් අයවැයගත ඇස්තමේන්තු සමඟ සසඳා නොතිබූ අතර, විචලනයන් පිළිබඳ ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ වූ නිශ්චල වත්කම් හඳුනාගෙන ඒවායේ වටිනාකම් නිශ්චය කර, ඒ අනුව වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 571 | අවුරුදු 02 ක ඉක්මවූ රු.180,245 ක් වූ තැන්පතු බේරුම් කිරීමට/ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු. 1,242,843 ක්වූ අතර, පෙර වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ රු. 2,731,376 ක අතිරික්තය සමඟ සැසඳුවිට රු. 1,488,553 මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අනෙකුත් ආදායම රු. 1,648,200 ක් වූ අතර තත්‍ය ආදායම රු. 209,101 ක් විය. හිඟ ආදායම රු. 1,439,098 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

2.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිසමේ චක්‍රලේඛයේ 1:2 ඡේදයට අනුව මාර්ග දිර්ඝ කාලයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා මාර්ගවල බොරළු ඇතිරීම වැනි තාවකාලික පියවර ගැනීමෙන් වැළකී, කාර්පට් කිරීම, තාර දැමීම සහ කොන්ක්‍රීට් කිරීමේ වැඩ කළ යුතු වේ. එනමුත් චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින් මාර්ග පහක් රු. 4,779,010 ක පිරිවැයක් දරමින් සභාව විසින් බොරළු අතුරා තිබුණි.

(ආ) පුරනැඟුම වැඩසටහන යටතේ සූරියනගර් කෝවිල පාර රු. 7,701,794 පිරිවැයකට කොන්ක්‍රීට් කිරීම සඳහා 2016 ජනවාරි 27 දින අරූන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද කාර්යසාධන බැඳුම්කරය තහවුරු කිරීම සඳහා සභාව බැංකුව වෙත ඉදිරිපත් කර තිබුණි. එනමුත් බැංකුව විසින්

ලිඛිතව දන්වා තිබුණේ මුදල් ගෙවා නොමැති නිසා ආරක්ෂිත බැඳුම්කරය ඉදිරිපත් කර නොමැති බැවින් කොන්ත්‍රාත්තුව පසුව අවලංගු කළ බවය. ව්‍යාජ බැඳුම්කරය ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුට එරෙහිව නීති ක්‍රියාමාර්ගයක් ගැනීමට සහ කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. මෙමගින් ඉදිරියේදී කොන්ත්‍රාත්කරුට එවැනි වංචනික කටයුතුවල යෙදීමට හැකියාව සැලසෙනු ඇත.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී භාවිතා කරන වාහන 06 ක් වර්ෂ 06 ක් පුරාම ඒවායේ අයිතිය පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් මූල්‍ය රීති 16.33 විධිවිධාන පරිදි දින 10 ක් තුළදී අත්තිකාරම් පියවිය යුතු වේ එනමුත් වසර 02 සිට වසර 10 ක කාලපරාසයක් සඳහා වූ රු.663,213 ක් වූ අත්තිකාරම් පිළිබඳව එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 04 සිට වසර 10 ක කාල පරාසයක් සඳහා වූ රු. 131,001 ක්වූ ටෙන්ඩර් තැන්පතු, රඳවාගත් මුදල් සහ මිශ්‍ර තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) ආදේශක සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදල් සඳහා වූ දායක මුදල් සඳහා ඔවුන්ගේ දළ වැටුප පාදක කර ගත යුතුවේ. එනමුත් ආදේශක කම්කරුවන් තිදෙනෙකු වෙනුවෙන් 2016 වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ඔවුන්ගේ මූලික වැටුප් පදනම්ව ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු. 62,791 ක මුදලක් අරමුදලට අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි.

(ඉ) 2012 වර්ෂය තුළදී ජන අවශ්‍යතා සංවිධානය විසින් සභාවට පරිත්‍යාග කළ රු. 1,483,487 ක් වටිනා අයිස් නිපදවීමේ කර්මාන්ත ශාලාව අපේක්ෂිත අරමුණු සඳහා සභාව විසින් උපයෝගී කරගෙන නොතිබුණි. එහි සවිකර තිබූ ශීතකරණ මෝටර් සහ ජල ටැංකි අළුත්වැඩියා කළ නොහැකි අන්දමින් හානියට පත්ව තිබුණි.

(ඊ) තක්සේරු කිරීමෙන් තොරව සහ ටෙන්ඩර් නොකැඳවා සභාවට අයත් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර හතක් 2015 සිට 2017 දක්වා කුලියට දී තිබුණි.

(උ) ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ වැඩසටහන් යටතේ, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් රු. 6,000,000 ක් වෙන්කර තිබුණ. එනමුත් ඉටුකළ යුතු වැඩ සඳහා වූ ඇස්තමේන්තු සකසා නොතිබූ අතර වැඩ ආරම්භ කර නොතිබුණි. ඒ හේතු කොට ගෙන සභාවට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

3. අක්‍රීය වත්කම්
-----------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) රු. 2,272,800 ක් වටිනා කඩ කාමර 07 කින් සමන්විත සභාවේ වෙළඳ සංකීර්ණය 2011 වර්ෂයේ පටන් අක්‍රීයව පැවතිණි.

(ආ) රු. 1,451,750 ක් වටිනා සී සෑමේ යන්ත්‍රයක්, ද්විරෝද සෑමේ යන්ත්‍රයක්, මාර්ග තලනයක් හා ත්‍රිරෝද රථයක් වසර 04 ක් තිස්සේ සභාවේ අක්‍රීයව පැවතිණි. ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි.

4. යහපාලන සහ ගිණුම්කටයුතු භාවය
-------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ III පරිච්ඡේදයේ 168(1) විධිවිධාන පරිදි මූල්‍ය ප්‍රකාශන මාර්තු 31 දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වේ. එනමුත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 02ක ප්‍රමාදයකින් පසුව 2017 ජුනි 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය

-------------------------------

2016 වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණයේදී පුස්තකාල පොත් 331 ක ඌනතාවයක් පෙන්වාදී තිබුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

4.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

සංවර්ධන නිලධාරීන් තිදෙනෙකුගේ පුරප්පාඩු පිරවීම සඳහා පසුගිය වසර 02 ක තුළදී ක්‍රියාකර නොතිබුණි. තවද, ආදේශකයන් නොමැතිව කළමනාකරණ සහකරුවන් දෙදෙනකු මාරු කර තිබූ අතර කළමනාකරණ තනතුරු 03 ක් පුරප්පාඩු වී තිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සඳහා විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණ | i. ලෙජර් විධිමත්ව යාවත්කාලීනව පවත්වා ගෙන යාම.<br>ii. වත්කම් වර්ගීකරණය<br>iii. ණයගැති සහ ණයහිමි ලෙජර පවත්වාගෙන යාම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාම.<br>ii. ගබඩා ලෙජරය විධිමත්ව පවත්වා ගෙන යාම. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | අයකර ගැනීම සඳහා ක්‍රියා කළ යුතු වේ. |
| (ඈ) | සේවක කළමනාකරණය | නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී ඒ වෙනුවෙන් නැවත නිලධාරීන් ලබා ගැනීමට සැලකිලිමත් විය යුතු වේ. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ මුදල් කොමිසමේ චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුවේ. |